# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No: 10120

ෆැක්ස් / தொலைநகல / Fax: 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone: 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site: www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail: dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO: 818/ 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No: / 2024

දිනය / திகதி / Date: 15/05/2024 පැය 1505

# මාධ්‍ය නිවේදනය

## සැකකරුවන් 14 දෙනෙකු අත්අඩංගුවට ගැනීම - ගල්කිස්ස විශේෂ අපරාධ විමර්ශන අංශය

2023.12.29 වන දින වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමණාකරන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ගල්කිස්ස විශේෂ අපරාධ විමර්ෂණ අංශය වෙත ව්‍යාජ අත්සන් යොදා කූඨ ලේඛණ සකස් කරන ලද බවට සිදු කරන ලද පැමිණිල්ලකට අදාලව ගල්කිස්ස ගරු මහේස්ත්‍රාත් අධිකරණය වෙත කරුණු වාර්තා කර විමර්ශන කටයුතු සිදු කරමින් පවතී.

මෙම පැමිණිල්ලට අදාලව වැඩිදුර විමර්ශන සිදු කිරීමේදී පැමිණිලිකරුගේ අත්සන ව්‍යාජව යොදා ලේඛණ සකස් කර ඉදිරිපත් කිරීම, පැමිණිලිකාර ආයතනය වෙත සුරාබදු බලපත්‍රය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කර ඇති බදු ඔප්පු ව්‍යාජ බවට අනාවරණය වීම, සාපරාධී අයුතු ඇතුල් වීම සිදු කිරීම, හා ප්‍රශ්නගත දේපල රජයේ දේපලක් වන බවට අනාවරණය වීමෙන් පොදු දේපල විෂයෙහිලා යන වැරදි පිළිබඳ පනත ප්‍රකාරව වරදක් සිදු කර ඇති බවට අනාවරණය වී ඇත.

විමර්ෂනයේදී අනාවරණය වන ලද ඉහත කරුණු සම්බන්ධයෙන් 2024.05.13 වන දින ගරු අධිකරණය වෙත වැඩිදුර වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත. මෙම විමර්ෂන සිදු කිරීමෙන් පසුව අංක 44, කැම්බල් පෙදෙස, දෙහිවල ලිපිනයේ පිහිටි සෝල් බීච් ආයතනය වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් කඩා ඉවත් කිරීමෙන් අනතුරුව එම කඩා ඉවත් කරන ලද ගොඩනැගිල්ල් නැවත ඉදිකරන බවට නිරීක්ෂණය වී ඇත.

අනතුරුව මේ සම්බන්ධයෙන් පරීක්ෂා කර ගල්කිස්ස කොට්ඨාස ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීවරයාගේ උපදෙස් අනුව ගල්කිස්ස විශේෂ අපරාධ විමර්ශණ අංශයේ නිලධාරීන් කණ්ඩායමක් 2024.05.14 වන අද දින ඉහත ලිපිනයට යාමේදී මෙම රජය සතු දේපලෙහි ඉදිකිරීම් කටයුතු නැවත කරගෙන යමින් සිටින බවට නිරීක්ෂණය වීම හේතුවෙන් සැකකරුවන් 14

දෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත. සැකකරුවන් ගල්කිස්ස ගරු මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව 2024/05/28 වන දින දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කර ඇත.

ගල්කිස්ස විශේෂ අපරාධ විමර්ෂන අංශය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**